Nestlé Good food, Good life

# මාධ්‍ය නිවේදනය

2023, දෙසැම්බර් 04, කොළඹ

## නෙස්ලේ ලංකා පොල් මද ආශ්‍රිත නිෂ්පාදන ක්ෂේත්‍රයේ හොඳම අපනයනකරු ලෙස ජනාධිපති සම්මාන දිනයි

පසුගියදා පැවැති 25 වැනි ජනාධිපති අපනයන සම්මාන උළෙලේදී 2021/22 සහ 2022/23 මූල්‍ය වර්ෂවලදී පොල් මද ආශ්‍රිත නිෂ්පාදන ක්ෂේත්‍රයේ හොඳම අපනයනකරු සම්මානය දිනාගැනීමට නෙස්ලේ ලංකා සමාගම සමත්විය. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන මෙම සම්මාන උළෙල හරහා මෙරට අපනයන ක්ෂේත්‍රයට සුවිශේෂී දායකත්වයක් සැපයූ සමාගම් අගයනු ලැබේ.

"මෙරට අපනයන ශක්තිමත් කිරීමට අප ගනු ලැබූ අඛණ්ඩ උත්සාහයන් මෙසේ ඇගයීමට ලක්වීම ගැන අපි මහත් සේ ආඩම්බරයට පත්වෙනවා. විශේෂයෙන්ම මෙම අභියෝගාත්මක කාලපරිච්ඡේදයේදී, අඛණ්ඩව වසර තුනක් පුරාවට පොල් මද ආශ්‍රිත නිෂ්පාදන ක්ෂේත්‍රයේ හොඳම අපනයනකරු ලෙස සම්මානයට පාත්‍රවීම තුළින් අපගේ කණ්ඩායමේ නොසැලෙන අධිෂ්ඨානය සහ කැපවීම වඩා හොඳින් පිළිබිඹු කරයි. අපගේ ව්‍යාපාර මෙහෙයුම් තුළින් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ධනාත්මක දායකත්වයක් දැක්වීමටත්, දේශීය පොල් කර්මාන්තයට සහාය වීමටත්, අපගේ ගොවි ප්‍රජාවට තිරසර ජීවනෝපායක් නිර්මාණය කිරීමටත්, අපනයන හරහා විදෙස් විනිමය උපයමින් රටේ විදෙස් විනිමය සංචිතය ශක්තිමත් කිරීමටත් හැකිවීම ගැන අපි නිහතමානීව සතුටට පත්වෙනවා", යනුවෙන් නෙස්ලේ ලංකා කළමනාකාර අධ්‍යක්ෂ බර්නාඩ් ස්ටෙෆාන් මහතා ප්‍රකාශ කළේය.

1986 වර්ෂයේදී නෙස්ලේ සමාගම මැගී පිටිකළ පොල් කිරි නිෂ්පාදනය හඳුන්වා දුන් අතර, එතැන් පටන් වසර 37ක් පුරා ශ්‍රී ලාංකික පොල් ගොවීන් 6,000කට වැඩි ප්‍රමාණයකගේ අභිවෘද්ධිය වෙනුවෙන් සහාය වී තිබේ. ඉකුත් වසරේදී නෙස්ලේ සමාගම නැවුම් පොල් මිලියන 96කට වැඩි සංඛ්‍යාවක් ගොවීන්ගෙන් මිලදී ගනිමින් ග්‍රාමීය ප්‍රජාව වෙත රුපියල් බිලියන 6.2ක මුදලක් වෙත ලබාදී තිබේ. එමෙන්ම ශ්‍රී ලංකාවේ විශාලතම පිටිකළ පොල්කිරි අපනයනකරුවෙකු ලෙස 2022/23 මූල්‍ය වර්ෂය තුළ රුපියල් බිලියන 10.72ක අපනයන ආදායමක් ශ්‍රී ලංකා ආර්ථිකයට දායක කිරීමට ද නෙස්ලේ ලංකා සමාගමට හැකිවිය. මීට අමතරව, නෙස්ලේ පොල් වගා සැලසුම හරහා ග්‍රාමීය පවුල් 4,500කට දෙමුහුන් පොල් පැළ බෙදාදෙමින්, ඔවුන්ට අවශ්‍ය තාක්ෂණික මඟපෙන්වීම මෙන්ම පූර්ණ පුහුණුවක් සහ සංවර්ධන වැඩසටහන් ද සංවිධානය කිරීමට සමාගම පියවර ගෙන ඇත.

"මෙම ඇගයීම පිළිබඳව අපි නිහතමානී සතුටක් ලබනවා. නෙස්ලේ ගුණාත්මකභාවයේ විශ්වාසය පෙරදැරි කොට ගෙන, මීට දශක තුනකට ඉහතදී අපි මැගී පිටි කළ පොල් කිරි

නිෂ්පාදනය පාරිභෝගිකයින්ගේ පහසුව උදෙසා හඳුන්වා දුන්නෙමු. ගෙවුණු දශක තුනක කාලය තුළ ශ්‍රී ලංකාවේ පමණක් නොව ලොව පුරා රටවල් 50කට වැඩි සංඛ්‍යාවකට ව්‍යාප්ත වුණු නිෂ්පාදනයක් බවට එය පත්වීම පිළිබඳව මම බෙහෙවින් ආඩම්බරයට පත්වෙනවා", යනුවෙන් නෙස්ලේ ලංකා අපනයන අංශ ප්‍රධානී ඩිෂාන් විජයවර්ධන මහතා පැවසුවේය.

නෙස්ලේ ලංකා සමාගම වසර 115කට අධික කාලයක් පුරා ශ්‍රී ලාංකිකයින්ගේ ජීවිත තුළට බද්ධ වී ඇත. ශ්‍රී ලංකාව තුළ අලෙවි කරන නෙස්ලේ නිෂ්පාදනවලින් 90%කට වැඩි ප්‍රමාණයක් කුරුණෑගල පිහිටි එම සමාගමට අයත් කර්මාන්තශාලාවේ දැඩි සුරක්ෂිතතා සහ ගුණාත්මක ප්‍රමිතීන් මත නිපදවනු ලබයි. 'වර්තමාන මෙන්ම අනාගත පරපුරටත් ජීවිතයේ ගුණාත්මකබව වර්ධනය කිරීමේ' අරමුණ සමඟ ක්‍රියා කරන නෙස්ලේ සමාගම, ඉහළ ගුණාත්මකබවින් යුතු සිය ආහාර සහ පාන වර්ග නිෂ්පාදන පෙළ හරහා මුල් ළමාවියේ සිට වැඩිහිටි විය දක්වා පුළුල් පරාසයක පාරිභෝගිකයින්ට සමීප වී ඇත.

---


**Contact:**

| | | | |
|---|---|---|---|
| Corp. Public Affairs | Damitha Kulatunga | +94777915949 | Damitha.Kulatunga@lk.nestle.com |